**මදුරාවල ප්‍රාදේශීය සභාව - 2024**
**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මදුරාවල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනු කූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ප්‍රමිතියේ 3 පරිච්ඡේද අංක 3.32ඡේදයට අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනයේදී පොලී ආදායම රු.30,440 ක් ඌනතාවයට ගැලපුම් කර නොතිබුණු අතර වෙනත් ජංගම වත්කම්වල ශුද්ධ වැඩිවීම රු.1,754,348 ක් වෙනුවට රු.9,668,713 ක් ද ගෙවිය යුතු දැවල ශුද්ධ වැඩිවීම රු.8,917,036 ක් වෙනුවට රු.8,582,076 ක් ද වෙනත් ජංගම වගකීම්වල අඩුවීම රු.302,709 ක් වෙනුවට රු.346,210 ක් ද ලෙස දක්වා තිබුණි. | 2025 වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කරන බව . | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩා ලෙජරයට අනුව කාණු බුරුසු තොග ශේෂය රු.2,430 ක් වුවත්, තොග ගිණුමට රු.48,988 ක් ලෙස දක්වා තිබීමෙන් තොග ශේෂය රු.46,558 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි ලිපි ද්‍රව්‍ය තොග ශේෂයන් ගිණුම්ගත කිරීමේදී මිලදී ගත් වටිනාකම නිවැරදිව සටහන් නොකිරීම හේතුවෙන් ලිපි ද්‍රව්‍ය තොග ශේෂය රු.68,357 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වියදම් ලැබීම රු.6,899,152 ක් වුවත් රු.35,728,509 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |

## 1.7 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 | වාහන 09 කට අදාලව ලොග් පොත් යාවත්කාලින කර නොතිබූ අතර ධාවන සටහන්වල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ලොග් පොත් යාවත්කාලින කරන අතර ධාවන සටහන්වල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන 10 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සියළු වාහන සඳහා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.2,820,313 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.150,222 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2024 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,784,574 | 4,794,233 | 3,464,027 | 1,330,207 | 2,850,576 | 3,124,810 | 2,260,476 | 1,263,660 |
| (ii) | කුලී | - | - | - | - | 120,000 | - | - | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 430,000 | 433,000 | 433,000 | - | 920,000 | 943,610 | 943,610 | - |
| (iv) | වෙනත් ආදායම් | - | - | - | - | 10,434,357 | 736,389 | 6,818,082 | 386,052 |
| | | 4,214,574 | 5,227,233 | 3,897,027 | 1,330,207 | 14,324,933 | 4,804,809 | 10,022,168 | 1,649,712 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.1,263,660 ක් වූ වරිපනම් හිඟයෙන් වර්ෂය තුල රු.707,463 ක් හෙවත් සියයට 56 ක් අයකර ගෙන නොතිබුණි. | 2025 තුන්වන වන කාර්තුව වන විට හිඟ ශේෂයන් පවත්වාගෙන ගිය වරිපනම් දේපල හිමිකරුවන්ගේ දේපල තහනමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.3,092,336 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.1,001,894 ක් හෙවත් සියයට 32 ක් අයකර ගෙන නොතිබුණි . | හිඟ වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (iii) වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 01ත් 03 ත් අතර වරිපනම් හිඟය රු.718,113 ක් ද, වර්ෂ 03 ත් 05 ත් අතර හිඟය රු.122,723 ක්ද, වර්ෂ 05 ත් 10 ත් අතර හිඟය රු.89,942 ක් ද හා වර්ෂ 10 ට වැඩි හිඟය රු.39,359 ක් ද විය. | 2025 වර්ෂය අවසන් වීමට පෙර දේපල තහනම් කිරීම් කර අදාල හිඟ ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (iv) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.386,501 ක් වූ ජල බදු හිඟයෙන් වර්ෂය තුල රු.88,134 ක් හෙවත් සියයට 22 ක් අයකර ගෙන නොතිබුණි. | නීතිමය පියවර ගෙන අදාළ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (v) සමාලෝචිත වර්ෂය සඳහා ජල බදු බිල් කිරීම රු.1,138,839 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.314,593 ක් හෙවත් සියයට 27 ක් අයකර ගෙන නොතිබුණි . | හිඟ ශේෂයෙන් රු. 181,718 ක මුදලක් මේ වන විට අයකර ගෙන ඇති බව. | -එම- |
| **(ආ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.7,450,000 ක් හා මුද්දර ගාස්තු රු.41,981,790ක් විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ අය කර ගැනීමට ඉදිරියේ දී කඩිනමින් කටයුතු කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 දෙසැම්බර් 31 දින කැබ් රථයක එන්ජිමට සිදු වී තිබුණු හානිය විනිශ්චය සඳහා මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කර තිබුණද, අනතුරට පාදක වූ කරුණ, පුද්ගලයින් හා වටිනාකම නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. හානිය ප්‍රතිපූර්ණය සඳහා රු.1,168,257 ක් සභාව විසින් වැයකර තිබුණද වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හානියට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා පළාත් පාලන කොමසාරිස් වෙත ලිපි ඉදිරිපත් කර ඇති බව. | හානිය වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අය කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ අනතුරට පත්ව තිබූ රථයක් නැවත යථා තත්ත්වයට පත් කිරීමට වැය වූ රු.211,144 ක අළුත්වැඩියා වියදමින් රක්ෂණ සමාගමින් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වූ රු.74,415 ක අලාභය අය කර ගැනීමට හොරණ දිසා අධිකරණයේ නඩු පවරා තිබුණද 2023 වර්ෂයේදී විත්තිකරු මියයාම හේතුවෙන් අලාභය අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | රථයේ අනතුර හානි පාඩු ලේඛනයේ සටහන් කර ඇති බව. | උසාවි නියෝගය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් මදුරාවල හෙන්රි ජයවර්ධන අනුස්මරණ මහජන පුස්තකාලයෙහි 2024 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද පුස්තකාල පොත් සමීක්ෂණයේදී පුස්තකාලය සතු රු.23,015 ක් වටිනා පොත් 112 ක ඌනතාවයක් තිබූ අතර එම ඌනතාවය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වගකිව යුත්තන්ගෙන් අය කිරීමට කටයුතු කරන බව. | හානිය වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ පවතින පුද්ගලික සමාගමක් විසින් අපද්‍රව්‍ය තනුකකරණය සිදු නොකර පරිසරයට මුදා හැරීම පිළිබඳව රාජ්‍ය ආයතන ඒකාබද්ධව සිදු කරන ලද පරීක්ෂණයකින් පසු අඩුපාඩු නිවැරදි කර ගන්නා තෙක් එම ආයතනයේ පරිසර බලපත්‍රය තාවකාලිකව නතර කර තිබුණි. ඒ සඳහා ආයතනය වසා තිබූ කාල සීමාවට අදාලව රු.මිලියන 108 ක මූල්‍ය අලාභය | හිටපු සභාපතිතුමා විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී මහතාගෙන් වාචිකව උපදෙස් ලබාගෙන 2009.10.09 වන දින පැවති මහසභාවේ ඒකමතිකව තීරණය කර මෙම ගෙවීම් සිදුකර ඇති බව. | සභාව විත්තිකරුවන් ලෙස නම් කර පවත්වා ගෙන යන නඩු සම්බන්ධයෙන් පෙනී සිටීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරීගෙන් ලිඛිත උපදෙස් ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පියවීමට එම ආයතනය විසින් මදුරාවල ප්‍රාදේශීය සභාව එහි 06 වන විත්තිකාර පාර්ශවය වශයෙන් සඳහන් කර 2009 වසරේ හොරණ දිසා අධිකරණයේ නඩු අංක 4323/M යටතේ නඩු පවරා තිබුණි. විගණිත දින වන විටත් සභාව විසින් මෙම නඩුව සඳහා අවස්ථා 12 කදී එකතුව රු.642,000 ක නිතී වියදමක් සිදු කර තිබුණි. සභාව විත්තිකරු කර පවරන නඩු සඳහා නිතී වියදම් ලෙස අධික පිරිවැයක් දැරීමට සිදුවන බැවින් හා මූල්‍ය අලාභයන් ගෙවීමට සිදු විය හැකි බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුව විමසා උපදෙස් ලබාගත යුතු වුවද සභාව එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | දෙල්ගහවත්ත නැමති ප්‍රදේශයේ ළිඳක් පිහිටි අඩි 15x15 ක ඉඩම් කොටසක් සම්බන්ධයෙන් කළුතර මහා අධිකරණයේ අංක 122/16F(A) යටතේ පවතින නඩුවක් සඳහා විත්තිකරුවෙක් ලෙස සභාව පෙනී සිටිම වෙනුවෙන් නඩු ගාස්තු ලෙස අවස්ථා 02 කදී එකතුව රු.79,410 ක් ගෙවා තිබුණද ඉඩම් ලේඛනයේ එම ඉඩම් කොටස සඳහන් වී නොතිබූ අතර එහි නිත්‍යානුකූල අයිතිය සභාව සතු ද යන්න ද තහවුරු කර ගෙන නොතිබුණි. | බාහිර පාර්ශවයන් විසින් වරකාගොඩ ගම් සභාවට මෙම ඉඩම පරිත්‍යාග කර ඇති බවත් , නඩුවට පෙනී සිටීමට නිත්‍යානුකූල අයිතියක් පවතින බව. | -එම- |
| (ඇ) | වරකාගොඩ ප්‍රදේශයේ පවතින නොබෙදූ ඉඩමක ඉදිකර ඇති පොදු වැසිකිලියක් සම්බන්ධයෙන් අංක P/5439 දරන බෙදුම් නඩුවේදී සභාව පාර්ශ්වකරුවෙකු වශයෙන් සම්බන්ධ වී 2018 වර්ෂයේ පැවති නඩු වාර 02 ක් වෙනුවෙන් රු.11,000 ක් ගෙවා තිබුණ ද සභාවේ වත්කමක් ලෙස එය ලේඛනවල සඳහන් වී නොතිබූ අතර සභාවට එහි නිත්‍යානුකූල හිමිකමක් තිබේද යන්න තහවුරු කර නොගෙන නඩු වාර සඳහා පෙනී සිට තිබුණි. | මෙම ඉඩමේ නොබෙදූ ඉඩමෙන් කොටසක් පොදු වැසිකිලියක් සෑදීම සඳහා වරකාගොඩ ගම් සභාවට 1970 දී පවරා දී ඇති බව. | සභාව විත්තිකරුවන් ලෙස නම් කර පවත්වා ගෙන යන නඩු සම්බන්ධයෙන් පෙනී සිටීමේදී පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිතී නිලධාරිගෙන් ලිඛිත උපදෙස් ලබා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූර්ණය වෙනුවෙන් වැඩියෙන් ලැබී තිබුණු රු.8,790,570 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කරන බව පළාත් පාලන දෙපාර්මේන්තුවේ කොමසාරිස්වරයා විසින් දන්වා ඇති බව. | වැඩිපුර ලැබුණු මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඉ) | 2018 හා 2020 වර්ෂ දෙකෙහි පැවති එකතුව රු.587,740 ක කර්මාන්ත ණයහිමි | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |

ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබුණි.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයට පෙර මිලදී ගන්නා ලද ජල මීටර් 74 කින් සමාලෝචිත වර්ෂයේදී 11 ක් පමණක් නිකුත් වී තිබුණු අතර රු.204,750ක් වූ ජල මීටර් 63 ක් ගබඩාවේ ඉතිරිව පැවතුණි. මෙම ජල මීටර් නියමිත කාලය තුලදී භාවිතයට නොගැනීමෙන් අක්‍රිය තත්ත්වයට පත් වීමට ඉඩකඩ වැඩි බව නිරීක්ෂණය විය. | නව ජල මීටර් යෙදීමක් දැනට සිදුනොවන බැවින් අතිරික්තයෙන් භාවිතයට නිදහස් කෙරෙන ජල මීටර් ප්‍රමාණය සුළුතරයක් වන බවත්, ඒ සඳහා විකල්ප විසඳුමක් ද නොවන බව. | ජල පාරිභෝගික සංඛ්‍යාව වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.20,619,845 ක් වැය කර ඉදිකර තිබූ නාර්තුපාන බහුකාර්ය ගොඩනැගිල්ලෙහි සම්මන්ත්‍රණ ශාලාව වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමේ වැඩසටහන වැඩිහිටි බල මණ්ඩල සමඟ ගිවිසුම්ගතව සිදු කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව 2023 ජුලි 07 දින සභාව වෙත දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි. | බහුකාර්ය ගොඩනැගිල්ල විවිධ වැඩසටහන් සඳහා ප්‍රයෝජනයට ගන්නා අතර සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය වේදිකාවක්, ශබ්ද පරිපාලක පද්ධතියක්, ලයිට් වැනි අංග උපාංග නොමැති බව හා වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව . | නිශ්කාර්යව පවතින දේපල භාවිතයට ගතහැකි වන පරිදි අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ රු.1,940,000 ක් වැය කර ඉදි කරන ලද නාර්තුපාන වොලිබෝල් ක්‍රීඩා පිටියේ ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේදී අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව සම්බන්ධවී ඉදිරියේදී මෙම ක්‍රීඩාපිටිය භාවිතයට ගැනීමට කටයුතු කරන බව. | -එම- |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ඉඩම් මිණුම් කර ආරක්ෂාව තහවුරු කර නොතිබූ අතර පොදු ඉඩම් ප්‍රාදේශීය සභාව සතු බවට වෙන් කර හඳුනාගත හැකි වන පරිදි නාම පුවරු සවි කර නොතිබුණි. | සභාව සතු පොදු ඉඩම් හා ළිං හඳුනා ගැනීම සිදුකරමින් අදාළ නාම පුවරු ද මේ වනවිට සවිකරමින් පවතින බව . | සභාව සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 පෙබරවාරි 19 දිනැති අංක 01/2016 දරන බස්නාහිර පළාත් පාලන ලේකම්ගේ පාලන චක්‍රලේඛයේ 1.1.1 ඡේදය ප්‍රකාරව ආයතනය භාරයේ ඇති සියළු වාහන ආයතනයේ නමට පවරා ගැනීමට කටයුතු කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ට්‍රැක්ටර් රථයක් සභාව නමට පවරාගෙන නොතිබුණි. | ට්‍රැක්ටරය ප්‍රාදේශීය ලේකම් විසින් ආපදා අවස්ථාවලදී පරිහරණය සඳහා තාවකාලිකව ලබා දී ඇති බව. | ආයතනයේ ඇති සියළු වාහන ආයතනය නමට පවරා ගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතුව වොලිබෝල් ක්‍රීඩා පිටියක් තිබියදී ඉදිකිරීමේ අවශ්‍යතාව හඳුනා නොගෙන බාහිර පාර්ශවයන්ගේ බලපෑම් මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාදුන් රු.3,410,000 ක ප්‍රතිපාදන මත 2020 වර්ෂයේ නාර්තුපාන ඉඩමේ හා වල්පිට සුසානභූමිය අසල ඉදිකරන ලද ක්‍රීඩාපිටි දෙකට අදාල ඉඩම්වල අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාවට පවරාගෙන නොතිබුණි. | ක්‍රීඩා පිටි දෙකකට අදාල ඉඩම්වල පැවරීම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කරමින් පවතින බව. | සභාවේ නමට නොමැති දේපල සභාව නමට පවරා ගත යුතුය. |
| (ඈ) | මදුරාවල ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 20 ක හිමිකම සභාව වෙත පවරාගෙන නොතිබුණි. 1946 අංක 57 දරන පොදු සුසානභූමි හා පුද්ගලික සුසානභූමි පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළ යුතු වුවද, සුසානභූමි 17 ක ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කර නොතිබුණි. | සුසානභූමි සභාව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය සියළු කටයුතු මේ වන විට සිදු කර ඇති අතර සුසානභූමිවල ආරක්ෂිත වැට සකස් කිරීමට කටයුතු කරමින් පවතින බව. | සුසානභූමිවල හිමිකම සභාව වෙත පවරා ගත යුතු අතර ආරක්ෂිත වැට මායිම් ද සකස් කළ යුතුය. |

**3. 5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ද්විතීය මට්ටම යටතේ පුස්තකාලයාධිපති තනතුරු 02 ක්ද, කළමනාකරණ සහකාර තනතුරු 01 ක්ද, ආදායම් පරීක්ෂක තනතුරු 02 ක්ද, සෞඛ්‍ය පරීක්ෂක තනතුරු 01 ක්ද , පෙර පාසැල් ගුරු තනතුරු 02 ක්ද, ප්‍රාථමික මට්ටම යටතේ ආදාහනාගාර ක්‍රියාකරු , රියදුරු, මුරකරු , ආයුර්වේද සහායක හා සෞඛ්‍ය සහායක තනතුරු 01 බැගින්ද, වැඩ ක්ෂේත්‍ර කම්කරු , සෞඛ්‍ය කම්කරු තනතුරු 02 බැගින්ද පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. | සේවක පුරප්පාඩු පිළිබඳ පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇති බව. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ ආදායම් එකතු කිරීමට සෘජු දායකත්වයක් සපයන ආදායම් පරීක්ෂක තනතුරු 02 ක පුරප්පාඩුව දීර්ඝ කාලයක සිට පිරවීමට පියවර ගෙන නොතිබුණි. | අධිකරණ ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ආදායම් පරීක්ෂක තනතුරේ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව. | ආදායම් පරීක්ෂක පුරප්පාඩු පිරවීම සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ගයට තීරණයක් ලැබෙන තුරු සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ආදායම් එකතු කිරීම විධිමත්ව සිදු කළ යුතුය. |
| (ඇ) | බහු කාර්යසාධක බලකාය මගින් ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා 2023 ජූනි මස සිට අනුයුක්ත කරන ලද නිලධාරියෙක් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ නියෝග මත පිඹුර මූලික රෝහල සඳහා අනුයුක්ත කර සභාව විසින් ඒ සඳහා එකතුව රු.847,633 ක වැටුප් ප්‍රතිපූර්ණය කර තිබුණි. | පළාත් පාලන අමාත්‍යාංශය යටතේ සේවයේ නියුතුව සිටි කණිෂ්ඨ සේවකයින් සියල්ල නිත්‍ය සේවා ස්ථානවලට යොමු කිරීම තාවකාලිකව අත්හිටුවන ලෙස බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් නියෝග කර ඇති බව. | සභාවේ රාජකාරි ඉටු නොකරන ලද නිලධාරීන්ට සභාව මගින් වැටුප් නොගෙවිය යුතුය. |
| (ඈ) | සභාවේ රියදුරු නොවන සේවකයින් 05 දෙනෙකු සඳහා වාහන රාජකාරි පවරා තිබුණි. | සභාවේ පවතින වාහන 15 සඳහා රියදුරන් 04 දෙනෙකු පමණක් ප්‍රමාණවත් නොවන බැවින් වෙනත් සේවකයින් ආදේශක රියදුරු ලෙස අනුයුක්ත කර ඇති බව. | රියදුරු තනතුරුවල පුරප්පාඩු පුරවාගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම යටතේ ප්‍රජා සංවර්ධන හා ශුභ සාධන අංශ සඳහා අපේක්ෂිත අරමුණු 20 ක් යටතේ ඉටු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 80 ක් දක්වා තිබූ අතර 2024 දෙසැම්බර් මාසය වන විට අපේක්ෂිත අරමුණු 11 ක් සැලසුම් කළ පරිදි ඉටු කර නොතිබුණි. | 2024 වර්ෂය තුල මැතිවරණ දෙකක් පැවතීමෙන් එම කාල පරාසයන් තුල මහජනතාව සම්බන්ධ කර ගනිමින් ප්‍රජා සේවා පැවැත්වීමට නොහැකි වීම, සභාවේ අඩු ආදායම් තත්ත්වයද ඉහල මට්ටමක පැවතීමද මේ සඳහා හේතු වූ බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව සැලසුම් කළ ක්‍රියාකාරකම් ඉටු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්ම තුල එක් එක් ක්‍රියාකාරකම් වෙනුවෙන් කාර්යසාධන දර්ශක හඳුනාගෙන තිබුණද නිශ්චිත කාල සීමාවකට වරක් | 2024 වර්ෂයේ අප්‍රේල් මාසය ආරම්භයේ පටන් මෙම විෂය ආවරණය කිරීමේ නිලධාරියෙකු නොසිටීම හේතුවෙන් මෙම | -එම- |

| | | |
|---|---|---|
| එම දර්ශක අනුව ක්‍රියාකාරි සැලැස්මෙහි ප්‍රගතිය මිණුම් කර නොතිබුණි. | කටයුතු නිශ්චිත කාලසීමාවේදී සිදුකර ගැනීමට නොහැකි වූ බව. | |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය සභාවේ අභ්‍යන්තර විගණන සැලැස්ම තුල ක්‍රියාකාරකම් 21 ක් යටතේ විගණනය කළ යුතු අංශයන් දක්වා තිබුණද, 2024 දෙසැම්බර් මාසය වන විට විගණන විමසුම් 02 ක් පමණක් නිකුත්කර තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා මු.රෙ.133(1) අනුව අභ්‍යන්තර විගණනය ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා එහි කාර්යසාධනය ඉහල නැංවීම සඳහා සහය වන ක්‍රියාවලියක් ලෙස ක්‍රියාත්මක විය යුතු වුවද සභාවේ අභ්‍යන්තර විගණනය විසින් ඉඩම් අනුබෙදුම් සහතික කිරීම, වාහන උපයෝජනය , මාර්ග පළුදු, කර්මාන්ත ප්‍රගතිය , ප්‍රසම්පාදනය, මහජන පැමිණිලි වැනි විෂයයන් සම්බන්ධ ප්‍රමාණවත් විගණනයක් සිදු කර අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කර නොතිබුණි. | 2025 වර්ෂයේ විගණන සැලැස්මට අනුව කටයුතු කරන බව. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 ක වටිනාකම රු.3,770,000 ක් වූ අයවැයගත ප්‍රතිපාදන මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වැය කර නොතිබුණි. | ගිණුමට අදාල ලබාදී ඇති තොරතුරු හා සම්බන්ධ බව. | අයවැය ඇස්තමේන්තු පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැය විෂයයන් 21 ක වටිනාකම රු.837,000 ක් වූ අයවැයගත ප්‍රතිපාදන මුදලින් රු.761,316 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඉතිරිව පැවතුණි. එම ඉතිරිය අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 76 සිට සියයට 99 දක්වා පරාසයක විය. | -එම- | -එම- |